# නිවාඩු කාලයේ ලස්සන දවසක්



තෙනුලි කාරියවසම්

# නිවාඩු කාලයේ ලස්සන දවසක්

කතෘ : තෙනුලි කාරියවසම්

කතෘ : තෙනුලි කාරියවසම්
චිත්‍ර : තෙනුලි කාරියවසම්

ISBN 978-624-208-511-1

# පිදුම

පොතක් ලියන්නට

මාගේ ඇස් පෑදු

ආදරණීය ප්‍රමිතා වෙත්තසිංහ

ගුරු මෑණියන්ට

සෙනෙහසින් පුදමි......

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසා ය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේ ට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන '' හෙරණගත්කරණී'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

ඔන්න යාළුවනේ සෙනුලි, තෙනුලි කියලා ලස්සන අක්කා කෙනෙකුයි නංගි කෙනෙකුයි හිටියා.

මේ දෙන්නා ඉගෙන ගන්නේ එකම පාසලේ. පාසලේ නිවාඩු කාලය උදා වුණා.



''හොඳ ළමයි වගේ හිටියොත්, පාඩම් වැඩ ටික ඉවර කළොත් පුතාලව ගමනක් එක්කගෙන යනවා. '' තාත්තා කිවුවා.

'' අනේ ඒ කොහෙද තාත්තේ '' තෙනුලි ඇහුවා.

'' අපි කෝච්චියෙන් සත්තු වත්ත බලන්න යමු. ''

'' අනේ නියමයිනේ තාත්තේ. අපි කවදාවත් කෝච්චියේ ගිහින් නැහැ. සෙනුලි සතුටින් උඩ පැන්නා.



ඉතින් ගමන යන්න ආස නිසාම දෙන්නාම පාඩම් වැඩ ඉවර කළා.

සත්තු වත්තට යන දවස උදාවුණා.

දුම්රිය නැවතුම් පොළේ තිබුණු කෝච්චි දැකලා
මේ දෙන්නට හරි පුදුමයි.

"මෙච්චර දිග කෝච්චිත් තියනවාද අම්මේ ?"
තෙනුලි පුදුමයෙන් ඇහුවා.

" ඔව් පුතේ, මීටත් වඩා දිග කෝච්චිත් තියනවා "
අම්මා කිවුවා.





" ඇයි අම්මේ මේ මාමා කොළ පාට කොඩියක් වනන්නේ ? " තෙනුලි එහෙම අහද්දිම කෝච්චිය පිටත් වුණා.

" දැන් කෝච්චිය පිටත්වෙන්න අවසර දෙන්නයි කොළ පාට කොඩිය වනන්නේ " අම්මා කිවුවා.

බිංගෙවල් ඇතුලෙන්, ගඟවල් උඩින්, කුඹුරු මැදින් කෝච්චිය හූ හඬ නගමින් ඉදිරියට යද්දි මේ දෙන්නා ජනලයෙන් එළිය බල බලා සතුටු වුණා.



" ඔන්න පුතේ දැන් රතුපාට කොඩිය වනයි. කෝච්චිය කොළඹ නතර කරන්නයි යන්නේ " තාත්තා කිවුවා.




කෝච්චි ගමන ඉවර වෙලා දෙහිවල බස් එකක නැගලා සත්තු වත්තට ආවාම දෙන්නගේ සතුට තවත් වැඩි වුණා.

පළමුවෙනියෙන් ම හිටියේ මාළු යාළුවෝ. පාට පාට මාළුවෝ දැකලා තෙනුලිටත් මාළු ටැංකියක් ඕන වුණා.





මැකෝ ගිරව් කූඩුවේ එල්ලිලා කෑ ගැහුවා.

කොටිරාළට බයවුණ සෙනුලි තාත්තාගේ
පිටිපස්සේ හැංගුණා.

ගහක් උඩ හිටපු චිම්පන්සියාට හොඳටම නින්ද ගිහින්, පාට පාට කටුස්සෝ, බය හිතෙන කිඹුල්ලු, දිග ම දිග සර්පයෝ දිහා බයෙන් බලාගෙන හිටියා.



අලි රාළුව මාමා කෙනෙක් නැව්වා. ජිරාෆ් හිටියේ කොළ කන ගමන්. මුව පැටව් ටික නිදි. වයසක ඔටුරාළ හරිම ලොකුයි. පැස්බරා බෙල්ල දික් කරලා බැලුවා.

රිළාහාමිලා පැන පැන ගියා.

සෙනුලි සහ තෙනුලි අද ගොඩාක් සත්තු බැලුවා.



සත්තු වත්තෙන් එළියට එනකොට තාත්තා කැරකෙන බඹරයකුත් අරගෙන දුන්නා. ආයෙත් කෝච්චියේ එනකොට දෙන්නම ජනේලයෙන් එලියට බඹරය දමාගෙන එය කැරකෙන හැටි බලා සතුටු වුණා.



තෙනුලිගෙයි සෙනුලිගෙයි නිවාඩු කාලයේ ලස්සන දවසක් ගතවුණේ අන්න එහෙමයි.

පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත්, අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත්, සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළි දැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කළාප, පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දක් වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංශන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,

සෙනෙවිරත්න මහලේකම්

# ස්තූතිය

අකුරු කරන්නට සෙවන ලබාදුන් මහනුවර මහාමායා බාලිකා විදුහලේ විදුහල්පති තුමියටත්,

ප්‍රාථමික අංශයේ විදුහල්පති තුමියටත්,

පංතිභාර ගුරුතුමිය ප්‍රමිතා වෙත්තසිංහ ගුරු මෑණියන්ටත්, සියළුම ගුරු මෑණිවරුන්ටත්, පියවරුන්ටත්,

ආදරණීය අම්මා, තාත්තා, සහ අක්කිටත් මාගේ ස්තූතිය පුද කරමි.

